# බ්‍රිතාන්‍යයන් යටතේ ශ්‍රී ලංකාවේ දේශපාලන වෙනස්වීම්

## 4.2 කියවීම් පත්‍රිකාව

<u>නිදහස සඳහා උද්ඝෝෂණ</u>

ඩොනමෝර් ආණ්ඩු ක්‍රමය සංශෝධනය කරවා පාලන බලතල ලාංකිකයින්ට ලබාගැනීමට ඇමති මණ්ඩලය රාජ්‍ය මන්ත්‍රණ සභාව ලංකා ජාතික සංගමය ගෙනගිය උද්ඝෝෂණ වලට අමතරව මෙරට වාමාංශිකඋද්ඝෝෂණ ගෙන ගිය අතර ඔවුන් ඒ සඳහා සූරියමල් ව්‍යාපාරය යොදා ගන්නා ලදී .

- සූරියමල් ව්‍යාපාරය යනු ,

පළමුවන ලෝක සංග්‍රාමයෙන් ආබාධිත වූ පවුල්වල සුබසාධනය වෙනුවෙන් ආරම්භ කළ පොපිමල් විකිනීමේ ව්‍යාපාරය ප්‍රතිවිරුද්ධ ව්‍යාපාරයක් ලෙස ආරම්භ කළ ව්‍යාපාරයකි .සූරියමල් විකිණීමෙන් ලැබෙන මුදල් මෙරට දුප්පත් ජනතාවගේ සුභ සිද්ධිය වෙනුවෙන් වැය කරන ලදී. මල් වල ආදායම බ්‍රිතාන්‍යයට යැවූ අතර පොපි මල් මිලදී ගැනීම අධිරාජ්‍යවාදීන්ට පක්ෂපාතී වීමක් ලෙසත් සූරියමල් පැළඳීම නිදහස් සටනට දායක වීමක් ලෙසත් ප්‍රචාරය කළ අතර සූරියමල් ව්‍යාපාරය නිදහස් සඳහා ගෙනගිය උද්ඝෝෂණ වල ප්‍රචාරක ව්‍යාපාරයක් විය .

- අමාත්‍ය මණ්ඩලය හා ජාතික සංගමය

1939 දෙවන ලෝක සංග්‍රාමයේ දී බ්‍රිතාන්‍යයට ලංකාවේ සහය ලබා දුන් අතර යුද්ධය නිම වීමෙන් පසු ලංකාවට නව ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයක් අවශ්‍ය බව දන්වා සිටින ලදී .යුද්ධය පැවති දුෂ්කර අවස්ථාවේ ඇමතිමණ්ඩලය ලබාදුන් සහය නිසා පැහැදුණු මෙරට බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරවරයා ලංකාවට ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයක් ලබා දෙන ලෙස බ්‍රිතාන්‍යයට දන්වා යවන ලදී. 1942 සිට ලංකා ජාතික සංගමය ද අමාත්‍ය මණ්ඩලය සමඟ සහයෝගයෙන් කටයුතු කරමින් රටට නිදහස ලබා ගැනීම ප්‍රධාන අරමුණු කොට උද්ඝෝෂණයක නිරත විය. 1944 ඇමති මණ්ඩලය නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කෙටුම්පතක් සකස් කළ අතර එම යෝජනා ද සලකා බලා යෝජනා ඉදිරිපත් කිරීමට සෝල්බරි කොමිසම පත් කළ අතර එහි ප්‍රතිඵලයක් ලෙස 1945 දී පාර්ලිමේන්තු ආණ්ඩු ක්‍රමයක් යෝජනා කෙරිණි. 1945 නොවැම්බර් රාජ්‍ය මන්ත්‍රණ සභාවේ වැඩි ඡන්ද සංඛ්‍යාවකින් සෝල්බරි ආණ්ඩු ක්‍රමය අනුමත කරන ලදී .

.